මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන විධාන 2018 අංක 02 2018 පෙබරවාරි 08

# මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේ දී වටිනාකම් මත ණය අනුපාත

**2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12 වන වගන්තිය යටතේ නිකුත් කරන ලදී.**

මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණු සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් ප්‍රදානය කරනු ලබන ණය පහසුකම් වෙනුවෙන් වටිනාකම් මත ණය අනුපාත හඳුන්වා දීම සඳහා, මුදල් මණ්ඩලය විසින් පහත විධානයන් නිකුත් කරනු ලැබේ.

1 මුදල් ව්‍යාපාර පනත යටතේ බලගැන්වීම

1.1 මුදල් ව්‍යාපාර පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව, මුදල් සමාගම්වලට හෝ යම් කණ්ඩායමකට හෝ වර්ගයකට අයත් මුදල් සමාගම්වලට එම සමාගම්වල ව්‍යාපාර සහ ආයතනික කටයුතුවල යම් අංගයක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයට විධාන නිකුත් කළ හැකිය.

2. උපරිම වටිනාකම් මත ණය අනුපාත

2.1 2018 ජනවාරි 01 සිට, මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණු සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් ලබා දෙන ණය පහසුකම එම වාහන වල වෙළෙඳපොල වටිනාකමෙන් පහත දැක්වෙන ප්‍රතිශත වටිනාකම නොඉක්මවිය යුතුය.

(i) ලියාපදිංචි නොකළ වාහන සහ පළමු ලියාපදිංචියෙන් පසු වසරකට වඩා අඩු කාලයක් ශ්‍රී ලංකාව තුළ භාවිතා කරන ලද ලියාපදිංචි වාහන සඳහා,

**වගු අංක 01 - වටිනාකම මත ණය අනුපාත**

| වාහන වර්ගය | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන පන්තිය | විද්‍යුත් වාහන | වෙනත් |
|---|---|---|---|
| වාණිජ වාහන | C 1, C, CE, D 1, D, DE, G 1, G, J | 90% | 90% |
| මෝටර් කාර්, ක්‍රීඩා උපයෝගී වාහන (SUV) හා වෑන් රථ | B [(සැහැල්ලු ට්‍රක් රථ සහ තනි ආසන (single cab) කැබ් රථ හැර)] | 90% | 50% |
| ත්‍රී රෝද රථ | B 1 | 90% | 25% |
| වෙනත් ඕනෑම වාහන | A1, A, B පන්තිය යටතේ වර්ගීකරණය කර ඇති සැහැල්ලු ට්‍රක් රථ සහ තනි ආසන (single cab) | 90% | 70% |
| දෙමුහුම් මෝටර් කාර්, ක්‍රීඩා උපයෝගී වාහන (SUV) සහ වෑන් රථ | B [(සැහැල්ලු ට්‍රක් රථ සහ තනි ආසන (single cab) කැබ් රථ හැර)] | 70% | |

(ii) පළමු ලියාපදිංචියෙන් පසු වසරකට වඩා වැඩි කාලයක් ශ්‍රී ලංකාව තුළ භාවිතා කරන ලද ලියාපදිංචි වාහන සඳහා අනුපාතය සියයට 70 ක් විය යුතුය.

3. උපරිම වටිනාකම් මත ණය අනුපාතයෙන් නිදහස් කිරීම්

3.1 සංචාරක සහ/හෝ ප්‍රවාහන කටයුතු වල නිරත ඕනෑම සමාගමකට ඒවායේ මූලික ව්‍යාපාර කටයුතු සඳහා උපයෝගී කර ගැනීමට වාහන සංචිත මිලදී ගැනීමේදී ප්‍රදානය කරනු ලබන ණය පහසුකම් සඳහා ඉහත විධාන 2 හි සඳහන් සීමාවන් අදාළ නොවේ. එසේ වුවද, එලෙස මූල්‍යනය කරන ලද වාහන පළමු ලියාපදිංචි කිරීමේ දින සිට වසරක් ඇතුළත කිසිදු පුද්ගලයෙකුට හෝ ආයතනයකට පැවරීම සිදු කළ නොහැක.

3.2 මෙම වාහන ප්‍රභේදය සඳහා ණය පහසුකම් ලබා දීමේදී බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් අභ්‍යන්තර සීමාවන් පවත්වා ගත යුතු අතර, ප්‍රමාණවත් අවදානම් කළමනාකරණ ක්‍රමවේදයන් අනුගමනය කළ යුතුය.

4. වාහන සඳහා වෙනත් ණය පහසුකම්

4.1 ඉහත 2 හා 3 විධානයන්ට අනුව ප්‍රදානය කරන ලද ණය පහසුකම් හැර, මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිත කිරීමේ අරමුණු සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් ණය පහසුකම් ප්‍රදානය නොකළ යුතුය.

5. අර්ථ නිරූපන

5.1 ණය පහසුකම් යන්නෙන් අවසාන පාරිභෝගිකයා වෙත ප්‍රදානය කරනු ලබන කල්බදු මූල්‍යකරණ, කුලී සින්නක්කර පහසුකම් සහ මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණු සඳහා ලබා දෙන වෙනත් ණය පහසුකම් අදහස් වේ.

5.2 මෝටර් වාහනයේ වටිනාකම යන්නෙන් වෙළඳපොල වටිනාකම අදහස් වේ. මෝටර් වාහන වල වටිනාකම තක්සේරු කිරීමේ දී බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා පහත දැක්වෙන ක්‍රම උපයෝගි කළ හැකිය.

(i) අලුත්ම වාහන සඳහා - බලයලත් නියෝජිතයෙකු විසින් දෙනු ලබන වටිනාකම

(ii) පාවිච්චි කර මෙරටට ආනයනය කරනු ලබන වාහන සඳහා - රේගුවේදී සලකා බලන ලද වටිනාකම හෝ වාහන වෙළඳ ආයතන විසින් ලබා දෙන වටිනාකම

(iii) ලියාපදිංචි වාහන සඳහා - වෘත්තීය තක්සේරුකරුවෙකු විසින් ලබා දෙන වටිනාකම

5.3 බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් ණය පහසුකම ප්‍රදානය කරන අවස්ථාවේදීම වාහනයේ තක්සේරු වටිනාකම ලබා ගැනීමට සහ නිවැරදි හා සාධාරණ වටිනාකම ලබා දෙන බවට වගබලා ගත යුතුය.

5.4 විධාන 3.1 හි සඳහන් වාහන සංචිත යන්නෙන් වාහන දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අදහස් වේ.

5.5 විධාන 3.1 හි සඳහන් සංචාරක කටයුතු වල නිරත සමාගමක් යන්නෙන් සංචාරක කටයුතු වෙනුවෙන් සේවා සැපයීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හෝ වෙනත් අධිකාරියක් සමඟ ලියාපදිංචි වී ඇති සමාගමක් අදහස් වේ.

5.6 විධාන 3.1 හි සඳහන් ප්‍රවාහන කටයුතු වල නිරත සමාගමක් යන්නෙන් භාණ්ඩ හෝ මගීන් ප්‍රවාහනය කිරීමේ ව්‍යාපාර අරමුණු සඳහා ඕනෑම රාජ්‍ය අධිකාරියක් සමඟ ලියාපදිංචි වී ඇති ඕනෑම ව්‍යාපාර ආයතනයක් අදහස් වේ.

6. පෙර විධානයන් අහෝසි කිරීම්

6.1 මෙයින්, පහත දැක්වෙන විධානයන් අහෝසි කෙරේ.

(i) 2017 අංක 01 දරන මුදල් සමාගම් (මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේදී වටිනාකම මත ණය අනුපාතය) විධානය.

(ii) 2017 අංක 03 සහ 2017 අංක 04 දරන මුදල් සමාගම් (මෝටර් වාහන සඳහා ණය සහ අත්තිකාරම් ලබා දීමේ දී වටිනාකම මත ණය අනුපාත විධාන සංශෝධනය කිරීම) විධාන.

ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
**මුදල් මණ්ඩලයේ සභාපති සහ**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**